**පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීත්, ඒවා ඉදිරිපත් කිරීමේදීත් අනුගමනය කළ යුතු පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති නියමිත අයුරින් අනුමත කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට සභාවේ ලේකම්වරයා සහ පලාත් පාලන කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරනු ලැබේ. |

### (ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් එකතුව රු.4,989,659 ක් වටිනා ඉඩම් කොටස් 25 ක්, වාහන අලුත්වැඩියා, වටිනාකම් තක්සේරු සහතික, තාක්ෂණික | සභාවට අයත් දේපල සම්බන්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අදහස් විමසීම්, | පුදුකුඩිඉරිප්පු සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුසාරයෙන් වූ ඉඩම් පරිහරණ කමිටු විසින් නිර්දේශ කිරීම් සහ දිස්ත්‍රික් නොවන ඉඩම් පරිහරණ කමිටුවල අනුමැතිය ලබාගෙන |

| | | |
|---|---|---|
| ඇගයීම් වටිනාකම සහ ඉඩම් මිනින්දෝරු ප්ලෑන යනාදිය ඉදිරිපත් කර නොතිබීමෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | එකඟතාවයන් සහ අනුමැතිය සහිතව එමගින් ඉඩම් හිමිකම් ඔප්පු ලබාගෙන මිනින්දෝරු ප්ලෑන මගින් සාක්ෂි සමග අනුමත මිල තක්සේරුකරු හෝ රජයේ තක්සේරුකරුගෙන් ඒවායේ වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට සභාවේ ලේකම්වරයා සහ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කාල ප්‍රමාදයකින් තොරව ක්‍රියාමාර්ග ගත යුතුය. | පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට අදාල ලේඛන ඉදිරිපත් කර ඇත. සභාව සතු ඉඩම් ලේඛන පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නමට ලබාදීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**(ඈ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුස්තකාල සඳහා පොත් මිලදී ගෙන නොතිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින එකතුව රු.482,449 කට චෙක්පතක් ලියා මේ දක්වා කාර්යාලයේ රඳවා තබා තිබුණි. | ගෙවීම් සහතික කළ නිලධාරියා සඳහා විමර්ශන කටයුතු සිදුකර නියමිත පරිදි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අපට ලැබිය යුතු පොත්, නොඑවීම නිසා චෙක්පත නිකුත් කර නොතිබුණි. මෙවැනි දෝෂ ඉදිරියේදී සිදු නොවන අයුරින් මිලදී ගැනීම් කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) පරිච්ඡේදය III රීති 33 | දේපල බදු පිළිබඳ තක්සේරු කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දේපල බදු පිළිබඳ තක්සේරු කිරීම් කඩිනමින් සිදුකර දේපල බදු තක්සේරු කර සෑම කාර්තුවකම සභා ප්‍රදේශයට අයත් දේපලවලින් නියමිත පරිදි අයකර ගැනීම් සිදුකර ආදායම් කළමනාකරණය | දේපල සඳහා වටිනාකම තක්සේරු ක්‍රියාවලිය අවසන් වූ පසුව බදු අයකිරීමේ ඉදිරි කටයුතු සිදු කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිවැරදි කිරීමට සභාව විසින් ක්‍රියාකළ යුතු වේ. | |
| (ii) | පරිච්ඡේදය V<br>රීති 140 | විවිධ සේවා සමුපකාර සමිතියකට ගෙවා තිබූ අත්තිකාරම් 06 ක එකතුව රු.274,367 ක් පසුගිය වර්ෂ 08 ක සිට නිරවුල් නොකර තිබූ බව නිරීක්ෂණය විය. ඒවා ලබා දීමේ අරමුණුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කිරීමට සභාව විසින් කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගතයුතු වේ. | සභා තීරණ මත මෙම වර්ෂ අවසාන ගිණුම් වාර්තාවේ නිරවුල් කිරිමට කටයුතු කර ඇත. |
| (iii) | පරිච්ඡේදය IX<br>රීති 180 | මුදල් ගබඩා සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | මුදල් හා ගබඩා සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් නියමිත කාලයේදී ඇප මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | අප සභාවේ නිලධාරීන් 14 දෙනෙකු ඇප මුදල් ගෙවීම සඳහා දැනුවත් කර ඔවුන්ගෙන් 07 දෙනෙකු සම්පූර්ණයෙන් ගෙවා එම මුදල් එම නිලධාරීන්ගේ නමට ස්ථාවර තැන්පතු ගිණුම්වල තැන්පත් කර ඇත. ඉතිරි නිලධාරීන් 07 දෙනාගෙන්ද (2019 ජුනි, ජුලි, අගෝස්තු) සම්පූර්ණයෙන් අයකර ගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ ලංසු ඇප තැන්පතු 12 ක්, ඇප මුදල් තැන්පතු 33 ක් සහ විවිධ තැන්පතු 33 ක එකතුව රු.4,901,920 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, වර්ෂ 02 සිට 07 ක් දක්වා තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | කල් ඉකුත් වූ තත්ත්වයේ පවතින මෙවැනි තැන්පතු අදාළ පාර්ශවයන්ට ආපසු නොගෙවීමට හේතු සභාව විසින් පරිශීලනය කර ඒ අනුව අදාළ පාර්ශව හඳුනාගෙන ඒවා ආපසු ගෙවීමට හෝ ඒවා ගැලපීමට විධිමත් අනුමැතින් සමඟ රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | තැන්පතු මෙම වර්ෂය තුළ ගැලපීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 වගන්තිය | එකතු කළ අගය මත බදු සභාව විසින් ගෙවූ පසු එහි ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල්වරයාට හා එහි පිටපත විගණකාධිපතිවරයාටත් යවා නොතිබුණි. | සඳහන් කර ඇති ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව කිසියම් මාසයක ගෙවන ලද එකතු කළ අගය මත බදු තොරතුරු වහාම ඊළඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. | මින් ඉදිරියේදී සෑම මාසයකම 15 වන දින යවනු ලබන බව ඔබ වෙත තහවුරු කරමි. |

## 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2015 අප්‍රේල් 21 දිනැති අංක SEC/Stampduty/2015/03 දරන චක්‍රලේඛය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට යැවිය යුතු මුද්දර ගාස්තු එකතුව රු.68,225 ක් පසුගිය මාස 01 සිට 24 දක්වා නොයවා තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණු අවස්ථා 49 ක් නිරීක්ෂණය විය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව මුද්දර ගාස්තු නියමිත කාලයේදී යැවීමට කටයුතු කළ යුතු වේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු ගෙවීමට කටයුතු කරමින් පවතී. කඩිනමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ආ) | දේශය ගොඩනැගීමේ බදු එකතුව රු.120,415 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට නොයවා පසුගිය වර්ෂ 05 ක් පුරා තැන්පත් ගිණුමේ රඳවා ගැනීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂයේ සභාවේ ආදායම් ගිණුමට මාරු කර තිබීම විගණනයේදී සෑහීමට පත්ව තහවුරු කළ නොහැකි විය. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස් විමසීමෙන් මෙම බදු ලැබීමේ මූලාශ්‍ර සභාවේ ලේකම්වරයා විසින් හඳුනා ගෙන අදාළ අනුමැතීන් ලබා ක්‍රියාමාර්ග නිවැරදිව අවසන් කළ යුතු වේ. | පළාත් විගණන නිලධාරීන්ගෙන් ලබාගත් උපදෙස් අනුව 2018.12.31 දින වර්ෂ අවසාන ගිණුම්වලට මාරු කර ඇත. |

### 1.4.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තොරවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.1,781,650 ක් වටිනා ගනුදෙනු 04 ක් සභාව විසින් අනුමත කර නොතිබූ නිසා ඒවා සතුටුදායක ලෙස පිළිගෙන විගණනයේදී තහවුරු කළ නොහැකි විය. | මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව අනුමත කළ පසුව ගෙවීම් සිදුකළ යුතු වේ. | 2018 දෙසැම්බර් මාස ගෙවීම් වවුචර් 177, 178, 180, 181 ආදිය සඳහා සභාවේ අනුමැතිය ලබා අනුමත කිරීමේ අත්සන් ද ලබා ගෙන ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 40,570,244 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 51,616,740 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 216,000 | 223,700 | 223,700 | – | 180,000 | 199,500 | 199,500 | – |
| (ii) | කුලී | 17,349,000 | 17,788,141 | 17,337,131 | 615,797 | 15,445,560 | 16,842,970 | 16,030,940 | 812,030 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 12,530,000 | 6,805,052 | 6,805,052 | – | 2,635,000 | 10,404,470 | 10,404,470 | – |
| (iv) | වෙනත් ආදායම් | 17,444,000 | 32,726,896 | 10,591,236 | 38,152,548 | 8,870,820 | 32,729,880 | 7,307,270 | 25,422,610 |
| | එකතුව | 47,539,000 | 57,543,789 | 34,957,119 | 38,768,345 | 27,131,380 | 60,176,820 | 33,942,180 | 26,234,640 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

අයවැය ඇස්තමේන්තු නිවැරදි ආකාරයෙන් පිළියෙල නොකිරීමත් ඇස්තමේන්තු නිවැරදිව සැලසුම් නොකිරීමත් නිසා අයවැය ඇස්තමේන්තුව හා තථ්‍ය ආදායම් අතර විචලනයන් පැවතුණි.

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ ණය ගිණුමේ දක්වා ඇති හිඟ කුලී සහ බදු එකතුව රු.615,797 ක වටිනාකමින් රු.164,760 ක් හිඟ මුදල් පසුගිය වර්ෂ 02 ක කාලයක සිට අය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්ෂ 02 කට අධික කාලයක සිට හිඟහිටව පවතින බදු ගාස්තු රු.615,797 ක් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සමාලෝචිත වර්ෂයේ ඔලුමඩු සහ පුදුකුඩිඉරිප්පු උප කාර්යාලවලට අයත් බල ප්‍රදේශවල ක්‍රියාත්මක වන ව්‍යාපාරික ස්ථාන 411 ක් ස්ථිර බලපත්‍ර ලබානොගෙන තාවකාලික බලපත්‍ර මත ව්‍යාපාර කටයුතු කරමින් තිබුණි. සභාව විසින් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්ථිර ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, බදු සහතික ලබා නොගෙන ක්‍රියාකරන ව්‍යාපාරික ආයතන හඳුනාගෙන ක්‍රියාමාර්ග ගත යුතු අතර, නියමිත වර්ෂයක් සඳහා ව්‍යාපාරික බදු තක්සේරු කර නියමිත කාලයේ නිසි පරිදි අයකර ගෙන වාර්ෂිකව සභාවේ ආදායම් ගිණුමට ගෙන ඒමට සුදුසු පියවර ගත යුතු වේ. | ස්ථිර බලපත්‍ර ගාස්තු ලබාදීමට අදාළ ව්‍යාපාරික ආයතනවලින් සම්පූර්ණ කරන ලද ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීමෙන් ස්ථිර බලපත්‍ර ලබාදිය නොහැකි වී ඇත. |

**2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු.36,505,190 ක් හා මුද්දර ගාස්තු රු.1,647,357 ක් ලැබිය යුතුව තිබුණි. | සභාවට අයත් උසාවි දඩ මුදල් ඒවා හිමිකම් පෑමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලීම් කිරීමෙන් ලබාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2017 සහ 2018 වර්ෂ සඳහා උසාවි දඩ මුදල් රු.15,788,841.09 ක් දැනට ලැබී ඇත. 2018 වර්ෂය සඳහා ආදායම් රු.20,716,349.08 ක් ලබාගැනීම සඳහා ඉල්ලීම් සිදුකර ඇත. ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,647,357.00කින් රු.1,439,608.00ක් ලැබී ඇත. ඉතිරිව |

ඇති රු.207,749.00ක් කඩිනමින් ලබාගැනීමට කටයුතු කරමින් පවතී.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් මාර්ග 06 ක් ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.20,926,805 ක් සුළු ණයහිමි ගිණුමට සලසා වියදම් ලෙස දක්වා තිබුණත්, අපේක්ෂිත මට්ටමේ ප්‍රතිඵල ළඟා කරගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාළ මූල්‍ය වර්ෂයේ අවසන් වූ කාර්යයන්වල ප්‍රමාණයන්ගේ වටිනාකම තක්සේරු කර මූලධන වියදම් ලෙස දැක්වීම හා ඒවායේ සැපයුම්කරුවන්ට නොගෙවූ සහතික කළ ගෙවීම් වවුචර්වල වටිනාකම් පමණක් සුළු ණයහිමියන් ගිණුමට ගිණුම්ගත කළ යුතුය. කෙසේ වුවත්, අදාළ ව්‍යාපෘති නියමිත කාලයේ ඉටුකර ඒවායේ ප්‍රයෝජන මහජනතාවට ලබාදීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාළ කාර්යයන් සඳහා අරමුදල් සුළු ණයහිමි ගිණුමේ දක්වා තිබුණත්, රටේ සිදු වූ ස්වභාවික විපත් හේතුවෙන් නියමිත කාලයේදී කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ බැහැර කරනු ලබන කැලිකසළ, ගිනිතැබීම හා වලදැමීම යන කාර්යයන් පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ව්‍යාපෘති ඇතුළත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | PSDG-2019 වැඩසටහනේ කොම්පෝස්ට් යාඩ් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. විවිධ පාටවලින් වෙන් කිරීමේ කසළ බඳුන් මිලදී ගැනීමට නියමිතය. කසළ වෙන්කර අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

### (ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින බාධක මෙන්ම ඉදිරි ක්‍රියාකාරකම් මැනීම සඳහා සුදුසු දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය සමඟ ක්‍රියාත්මක කිරීමට 2019.07.23 දින ලිපිලේඛන යවා ඇත. ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 08 ක වටිනාකම තක්සේරු කර පසුගිය වර්ෂ 01-05 දක්වා කාලයේදී මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඒවායේ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන සියළුම වාහනවල වටිනාකම් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. | වාහනවල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ එකතුව රු. මිලියන 54.3 ක් වටිනා මූලධන ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක නොකර මුළුමනින්ම අතහැර දමා තිබුණි. කෙසේ වෙතත් මේ සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සභාවේ වාර්ෂික අයවැය සැලැස්ම මූලික පදනම් උපයෝගී කරගෙන ප්‍රයෝජනවත් ආකාරයෙන් පිළියෙල කර මහජන අදහස් විමසීම සඳහා ප්‍රදර්ශනය කර සභාව විසින් අනුමත කර පිළියෙල කර ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරකම් සභාව විසින් සිදුකර නියමිත කාලයේ ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. | කාර්යයන් 14 කින් කාර්යයන් 02 ක් මාරු කර ඉටුකර තිබුණි. කාර්යයන් 02 ක් කල් දමා යථා කාලයේදී ඉටු කරනු ලැබීමට සභාව තීරණය කර තිබුණි. ඉතිරි කාර්යයන් 10, 2019 අයවැයේ වැඩසටහන්වල ඇතුළත් කර 2019 වර්ෂයේ කාර්යයන් ක්‍රියාත්මක කරමින් පවතී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුරප්පාඩුවී තිබූ සභාවේ සේවක පුරප්පාඩු 20 පිරවීමට කටයුතු නොකිරීමෙන් එම අයගෙන් කරගත යුතු සභාවේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රමාදයන් සිදුවී තිබූ බව විගණයේදී නිරීක්ෂණය විය. | සභාවේ දෛනික කාර්යයන් සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය ආදායම් පරීක්ෂක, පොළ සුපරීක්ෂක, සෞඛ්‍ය පරීක්ෂක, රියැදුරු, කම්කරු, සෞඛ්‍ය කම්කරු වැනි තනතුරු සඳහා අනුමත සේවක මණ්ඩලය ලබාගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්/ ප්‍රධාන ලේකම්වරයා විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැයිස්තු ගත කළ පුරප්පාඩු සම්බන්ධිත පත්වීම් බලධාරීන් මාර්ගයෙන් බඳවා ගැනීම් සිදු කළ යුතු වේ. |

### (ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවෙන් ස්ථාන මාරු වීම් ලබා ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.170,840 ක සේවක ණය ශේෂය මාස 15 කාලයක සිට අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන් ස්ථාන මාරු වී ගිය දෙපාර්තමේන්තු මාර්ගයෙන් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. | අදාළ රියදුරුගේ වැටුප් අත්හිටුවා ඇත. අදාල නිලධාරීට වැටුප් ගෙවීමේදී සේවක ණය අයකරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියාවන් සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පරිත්‍යාග කර තිබූ වාහන 02 ක් පසුගිය වර්ෂ 02 සිට 06 ක් දක්වා අලුත්වැඩියා තත්ත්වයේ පැවැති අතර ඒවා භාවිතා කළ හැකි ආකාරයට අලුත්වැඩියා කර භාවිතා කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | පරිත්‍යාග වශයෙන් ලැබූ වාහන සභාවට පවරාගෙන අලුත්වැඩියා කර ඵලදායී ආකාරයට භාවිතා කිරිමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වාහනයක් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පොදු 47 ආකෘති පත්‍රය මඟින් විකිණිය හැකි බව දක්වා ඇත. අනෙක් ට්‍රැක්ටරය අලුත්වැඩියා කළ හැකි බව දන්වා ඇත. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජය සහ රජයේ නොවන ආයතන විසින් ලබා දී සභාව විසින් භාවිතා කරන වාහන 15 ක් සඳහා වාහන ලියාපදිංචි කිරීමේ පොත් ලබාගැනීමට පසුගිය වර්ෂ 06 ක් පුරා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාව විසින් නියමිත පරිදි විගණන ලියාපදිංචි කිරීමේ පොත් ලබාගත් සභාවට අයත් වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | ලියාපදිංචි කිරීමේ පොත් නොමැති වාහන සඳහා පවරා ගැනීම් සම්බන්ධ කාර්යයන් මෙම වර්ෂ අවසානය තුළ සිදු කෙරේ. |
| (ආ) | රජයේ සහ රජයේ නොවන ආයතන විසින් සභාවට පරිත්‍යාග කරනු ලැබූ වාහන 08 ක අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලැබූ වාහන 08 ක් සභාවට පවරා ගැනීමට සභාව කටයුතු කළ යුතු වේ. | ලියාපදිංචි පොත් නොමැති මෙම වාහන 08 ක අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග වර්ෂ අවසානය තුළ සිදුකරන බව කාරුණිකව දැනුම් දෙමි. |

### 3.4.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සභාවේ වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 අනුව සිදු කළ යුතු පසු විපරම් ක්‍රියාමාර්ග මේ දක්වා මන්දගාමීව පැවතුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල **නිර්දේශයට** අනුව සිදු කළ යුතු පසු විපරම් ක්‍රියාමාර්ග අදාළ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරිමට ප්‍රථම සිදුකර අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා සාමාජිකයන් තෝරා ගෙන ඇත. කඩිනමින් අවසන් කර මේ පිළිබඳ වාර්තාව යවනු ලැබේ. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සභාවට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන | සභාව විසින් කඩිනමින් ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන | ඉදිරියේදි වෙනමම ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කිරිමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| පිළියෙල කර නොතිබුණි. | පිළියෙල කර අනුමත කරගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | |

### 3.5.2 භාණ්ඩ හා සේවාවන්
--------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසුකරුවකු විසින් ඉදිරිපත් කළ ලංසුවක් පිළිගැනීමෙන් පසුව විධිමත් පිළිගැනීමේ ලිපියක් ප්‍රසම්පාදන ආයතනය විසින් ලංසුකරුට භාරදිය යුතුය. තවද, රු.500,000 ඉක්මවන සෑම භාණ්ඩයක්ම හෝ සේවාවක් සඳහාම ගිවිසුමක් අත්සන් කළ යුතු වේ. මෙයට පටහැනිව සභාව විසින් සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිලදී ගෙන තිබූ භාණ්ඩ 04 ක එකතුව රු.2,633,736 ක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ගිවිසුම් අත්සන් කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 මාර්ගෝපදේශය ප්‍රකාරව, කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම දෝෂ සිදු නොවන පරිදි ගිවිසුම් සඳහා එළැඹෙන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපූරක මිලදී ගැනීමේ ක්‍රමයේ භාණ්ඩ ප්‍රසම්පාදනයේදී රු.මිලියන 1 සිට රු.මිලියන 5 දක්වා මිලදී ගැනීම්වලදී අඩුම ලියාපදිංචි කළ සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් කැඳවීම ලේඛන ලබාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකළ යුතු වුවත්, ලියාපදිංචි කළ සැපයුම්කරුවෙකුගෙන් පමණක් ලංසු මිලගණන් ලිපිලේඛන යවා එකතුව රු.1,257,000 කට වායු සමීකරණ 05 ක් මිලදී ගෙන තිබුණි. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පුවත්පත් දැන්වීම අනුව එක් සැපයුම්කරුවෙකු පමණක් අප වෙතින් ලංසු ඉල්ලුම් පත්‍ර ලබා ඉදිරිපත් කර තිබුණි. ඒ මත පදනම්ව භාණ්ඩ මිලදී ගැනීම්ද සිදු වී තිබුණි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
-------------------------------------

### 4.1 අයවැය පාලනය
-----------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැය සැලැස්ම නිවැරදි ක්‍රියාපටිපාටියක් අනුව සැලසුම් කර පිළියෙල නොකිරීම නිසා වැය විෂයයන් 06 ක ඇස්තමේන්තුගත | වාර්ෂික අයවැය සැලැස්මේ පවතින අයවැය විෂයයන් නිවැරදි ක්‍රියාපටිපාටියක් මාර්ගයෙන් සැලසුම් කර තක්සේරු කර ක්‍රියාත්මක | ඉදිරියේදී මෙම දෝෂ සිදු නොවන අයුරින් කටයුතු කරනු ලැබේ. |

හා තථ්‍ය වියදම් අතර සියයට 14 ක සියයට 97 ක් දක්වා පරාසයක විචලනයන් ද ආදායම් මාර්ග 05 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර පිළිවෙලින් සියයට 20 සිට සියයට 162 දක්වා විචලනයන් ද ඇති වී තිබුණි.

කිරීමට සහාව ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ.